# සෙක්ඛා පදයේ අර්ථ විවරණය

1. තීසු සික්ඛාසු ජාතාති = සෙක්ඛා
   - ජාත අර්ථයෙහි 'ණ' ප්‍රත්‍යය - ජාත තද්ධිතයකි.
   - සික්ඛිතබ්බාති = සික්ඛායො යනුවෙන් පළමුව විග්‍රහ කර ගත යුතු ය.
   - සික්ඛාසු ජාතාති = සෙක්ඛා

2. සත්තන්නං සෙක්ඛානං එතෙති = සෙක්ඛා
   - මෙහි 'සෙක්ඛා' යන පදය ඉදං තද්ධිතයකි ('එතෙ' යන්නෙහි 'ඉදං' යන අර්ථය ඇති බැවින්). 'ඉදං' යන අර්ථයේ 'ණ' ප්‍රත්‍යය යි.
   - 'සෙක්ඛානං' යන පදයේ 'සෙක්ඛ' යන්න ක්‍රම දෙකකට සාධනය කළ හැක
     I. නාමයෙන්
        - "සික්ඛනං = සික්ඛා" යනුවෙන් 'සික්ඛා' යන නාම පදය සකසා ගත යුතු වේ.
        - ඉන් අනතුරුව එම නාම පදයෙන් පරව 'ණ' ප්‍රත්‍යය එකතු කරගනිමින් 'සික්ඛා සීලං එතෙසං = සෙක්ඛා' යන තස්සීල තද්ධිතයක් ලෙස විග්‍රහය ගත හැක.
        - මෙම ක්‍රමයට 'සෙක්ඛා' යන පදයේ ස්වරූපාර්ථ වනුයේ ආර්ය පුද්ගලයන් සත් දෙනා ය.
     II. කිතක පදයෙන්
        - සික්ඛා ධාතුව + 'ණ' ප්‍රත්‍යය එකතු කරගනිමින් 'සික්ඛනං සීලං එතෙසන්ති = සෙක්ඛා' යන තස්සීල කිතක විග්‍රහය ගත හැක.
        - මෙම ක්‍රමයට ද 'සෙක්ඛා' යන පදයේ ස්වරූපාර්ථ වනුයේ ආර්ය පුද්ගලයන් සත් දෙනා ම ය.
   - මෙම ක්‍රම දෙක අතරින් කවර ක්‍රමයකට හෝ පදය සාධනය කොට ඒ 'සෙක්ඛා' යන පදයට ඉදං අර්ථයෙහි පැමිණෙන 'ණ' ප්‍රත්‍ය එකතු කිරීමෙන් 'සෙක්ඛා' යන ඉදං තද්ධිතය ලැබේ. එහි ස්වරූපාර්ථ වනුයේ ශෛක්ෂ පුද්ගලයන් සත්දෙනාට අයත් වූ සතර මාර්ගයන් සහ පහළ ඵල සිත් තුන ය.

3. සික්ඛා සීලං එතෙසන්ති = සික්ඛා
   - තස්සීල තද්ධිතයකි
   - සික්ඛා + 'ණ' ප්‍රත්‍යය = සෙක්ඛා